**යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2015**

**-------------------------------------------**

වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලයේ යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය හා 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාලය පිහිටුවීම

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාල පනතේ 5 (ඉ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 20 වගන්තියේ (1) උප - වගන්තිය යටතේ 2014 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක විය යුතු වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් පිළියෙල කරන ලද 2014 අංක 1 දරන වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාල ආඥාපනත යටතේ අනුබද්ධිත ආයතනයක් ලෙස යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය ස්ථාපනය කරන ලදී. මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5,6 හා 7 පිළිබඳ තාක්ෂණික පාඨමාලා සහ වෘත්තිය තාක්ෂණික විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද එම මට්ටමට සමාන්තර තාක්ෂණික පාඨමාලා පැවැත්වීමයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලයේ යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 135 (4) | ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂිකව පවරන ලද කාර්යයන් වලට අදාළ යාවත්කාලීන කරන ලද උපලේඛන විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 136 (6) | බලය දෙන නිලධාරියාගේ වාර්තා සහතික කරන නිලධාරියාගේ සම්මතයන් සමඟ යටත් පිරිසෙයින් මාසයකට වරක් සසඳා ප්‍රතිසංසන්දනය කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 262 (3) | සමාලෝචිත වර්ෂය තුළ කරන ලද එකතුව රු. 3,993,584 ක් වූ ගෙවීම්වලට අදාළව ආධාරක ලියකියවිලි 200 ක කෙටි අත්සන හා මුද්‍රාව ගෙවන නිලධාරියා විසින් තබා නොතිබුණි. |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 272 (1) | ගෙවීම් වවුචර් කිසිවක් ඒවාට අදාළ මාසයේ අවසානය සිට සති 6 ක් ඇතුළත මාසිකව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 756 | 2015 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 1645 | එක් එක් වාහනයෙන් කරන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශ හා සෑම මාසයක් සඳහාම දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර වාහන භාර නිලධාරියා විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 1646 | අලුත්වැඩියා හා නඩත්තු කටයුතු පිළිබඳ විස්තර වාර්තා කිරීම සඳහා වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. |

**(ආ) විශ්වවිද්‍යාල විද්‍යාතනය සඳහා මෙහෙයුම් අත්පොත**

| | |
|---|---|
| 4.6.2 (උ) වගන්තිය | ශිෂ්‍යයින්ගේ පුද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වා නොතිබුණි. |
| 4.6.2 (උ) වගන්තිය | සියලු ශිෂ්‍යයන්ට ශිෂ්‍ය හැඳුනුම්පත නිකුත් කර නොතිබුණි. |

**(ඇ) චක්‍රලේඛ විධිවිධාන**

| | |
|---|---|
| i 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| ii 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය අවම වශයෙන් මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතුය. කෙසේවුවද මෙම පරිපාටිය විද්‍යායතනයේ වාහන සඳහා සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 853,084 ක ඌනතාවයක් විය.

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අගය එකතු කිරීම රු. 89,646,048 ක් විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---

සමාලෝචිත වර්ෂය සඳහා මුළු මෙහෙයුම් වියදම රු. 63,093,653 ක් වුවද, මුළු වියදමින් සියයට 61 ක් නියෝජනය වන දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය රු. 38,421,673 ක් එයට ඇතුළත් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 මෙහෙයුම් දුර්වලතා**

---

අතිකාල, බැහැරයාම් වියදම්, ස්ථාවර වත්කම් හා අත්තිකාරම් ආදී ගනුදෙනු සටහන් කිරීම සඳහා ලේඛන පවත්වා නොතිබුණි.

**4.2 කළමනාකරණ දුර්වලතා**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල විද්‍යායතනයට අනුයුක්ත සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ඇඟිලි සටහන් යන්ත්‍රයේ අත්සන් තැබීමට පාලක මණ්ඩලය නියෝග කර තිබුණද, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් එම නියෝගය අනුගමනය කර නොතිබුණි.

(ආ) සේවකයන් විසින් ලබා ගන්නා ලද නිවාඩු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදය ප්‍රකාර විධිමත් පරිපාටියක් අනුගමනය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. නිලධාරීන් විසින් ලබා ගන්නා ලද නිවාඩු වැඩි ප්‍රමාණයක් වගකිව යුතු නිලධාරීන් විසින් අනුමත කර නොතිබුණි.

ii. නිවාඩු ලේඛන හා කෙටි නිවාඩු ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණි.

iii. සුදුසු වැඩ බැලීමේ ක්‍රමයක් නොමැතිව නිලධාරීන් නිවාඩු ලබා තිබූ බැවින් වෙනත් නිලධාරීන් ඒ සඳහා නොයෙදුණු බැවින් හදිසි කාර්යයන් ප්‍රමාද වී තිබුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 10 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 03 ක් වශයෙන් වූ පුරප්පාඩු 13 ක් පිරවීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතනය කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම්, වත්කම් ප්‍රකාශනයන්, මුල් තොරතුරු වාර්තා, පොදු 176, 169 හා 278 යනාදි ලියකියවිලි යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් පවත්වන ලද පුද්ගලික ලිපිගොනුවල නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 112 ක වටිනාකමට ඉදිකරන ලද ගොඩනැගිල්ලක පිපිරීම් රාශියක් තිබූ අතර ගොඩනැගිල්ලේ කොටසක් හානි වී තිබුණි. කොන්ත්‍රාත්කරුට ලබාදුන් දෝෂ වගකීම් කාලය තුළ ගොඩනැගිල්ලේ අලුත්වැඩියා සිදු කර ගැනීම සඳහා කළමනාකරණය විසින් මේ සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සියලු වාහන විවෘත ස්ථානයක ගාල් කර තිබුණි. මේ සම්බන්ධයෙන් විද්‍යායතනයේ වටිනා වාහනවල ආරක්ෂාව සඳහා වාහන ගාල් කිරීමේ ස්ථානයක් ඉදිකිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) ඉන්වෙන්ට්‍රි ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණු අතර, එබැවින් මිලදී ගත් දිනය, මිලදී ගන්නා ලද විෂයයන්වල වටිනාකම, ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලැබුණු දිනය ආදිය ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ඈ) ගබඩා භාරකරු විසින් ගබඩා ඉන්වෙන්ට්‍රි පවත්වා නොතිබුණි.

**4.5 වාහන සංචිතය කළමනාකරණය**

වාහන ධාවන සටහන් පැවැත්වීම පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඉන්ධන ඇණවුම් අංකය, දිනයන් හා ඉන්ධන බිල්පත්‍රවල අංක වාහන ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.
- වාහන ධාවන සටහන්වල ගමනේ අරමුණ සඳහන් කර නොතිබුණි.
- වාහන භාවිතයෙන් පසු නිලධාරීන් අත්සන් යොදා නොතිබුණි.
- වාහන සංචලනය පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.
- වාහන කාර්යසාධන සාරාංශ මාසිකව පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 30 ට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 18 දින දීය.

**5.2 ක්‍රියාකාරි සැලැස්ම**

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) හා 2014 පෙබරවාරි 17 දිනැති අංක පීඩ්/ආර්ඩී/01/04/2014/01 දරන චක්‍රලේඛ ලිපි අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

**5.3** **ව්‍යාපාර සැලැස්ම**

-------------------

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මෙහෙයුම් අත්පොතේ 2.4 වගන්තිය ප්‍රකාරව වර්ෂ 3 ක කාල පරිච්ඡේදයක් සඳහා ව්‍යාපාර සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**5.4** **ව්‍යාපාර ඒකකයක් ස්ථාපිත කිරීම**

------------------------------------

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මෙහෙයුම් අත්පොතේ 2.4.1 වගන්තිය ප්‍රකාරව ව්‍යාපාර ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**5.5** **අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම**

-------------------------------------------------

විද්‍යායතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ බැවින් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා රාශියක් නිරීක්ෂණය විය.

**5.6** **විගණන කමිටු රැස්වීම්**

-------------------------

පාලක මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර තිබුණද, 2005 ජූලි 01 දිනැති අංක පීඊඩී/31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, 2015 වර්ෂයේදී එක් කමිටු රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

**6.** **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරීගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | **ක්ෂේත්‍රය** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ගබඩා පරිපාලනය | ගබඩා විෂයයන් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | වාහන උපයෝජනය | වාහන ආරක්ෂිතව ගාල් කර නොතිබුණි. |